Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 01

විෂය:- නර්තනය

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

ශ්‍රේණිය :- 11

## ශ්‍රී ලාංකේය නර්තන කලාව හා සබැඳි ඓතිහාසික පසුබිම විස්තර කරයි.

## දේශීය වන්නම්වල පසුබිම හා විකාශනය

පියවර - 1 ශාන්ති කර්ම වලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයකි.

පියවර - 2 ද්‍රවිඩ භාෂාවේ එන වර්ණම් හෙවත් වර්ණනා යන වචන වලින් සිංහලයට බිඳී ආ වචනයකි.

පියවර - 3 මෙහි අදහස වැනුම හෙවත් වර්ණනාය යන්නයි.

පියවර - 4 උඩරට පහතරට සබරගමු යන සම්ප්‍රදායන් ත්‍රිත්වයටම පොදුය

**වන්නම් රචනාවීමේ ප්‍රස්තුත**

- කිසියම් ජීවී හෝ අජීවී වස්තුවක් හා සිද්ධි හා වස්තු ආදිය මුල් කොට ගෙන උඩරට හා සබරගමු වන්නම්
  රචනා වි ඇත.
- පහතරට සිංදු වන්නම් සෙත් ශාන්තිය පතා විෂ්ණු දෙවියන් ප්‍රස්තුත කොටගෙන රචනා වී ඇත.

**වන්නම් වල පොදු ලක්ෂණ**

- මුල් කාලයේ ගායනා පිණිස රචනා වීම
- තාල රූපයකට අනුව නිර්මාණය විම
- අදහස් ප්‍රකාශකිරීමෙන් තොර වන අතර ඒ ඒ සම්ප්‍රදායන්ට අයත් පද කොටස් නර්තනය කිරීම.
- පසු කාලයේ වන්නම් නර්තනය සඳහා යොදා ගැනීම

## උඩරට වන්නම්

- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ කාලයේ කවිකාර මඩුවේදී රාජකීයන්ගේ  හා වෙනත් ප්‍රභූන්ගේ විනෝදාස්වාදය උදෙසා රචනා වූබව සඳහන්වේ.

## උඩරට වන්නම් රචනාවීම පිළිබඳ විවිධ මත

- රම්මොළවක අධිකාරම් විසින් වන්නම් රචනා කොට මහ රජතුමාගෙන් ගම්වර ලබා ගත් බව (ජේ ඊ සේදරමන්මහතා  -නෘත්‍ය රත්නාකරය)
- දකුණු ඉන්දියාවේ නාගපට්ටනම් ස්ථානයේ ගෙන්වාගත් “ගණිතාලංකාර” බමුණු පඬිවරයා විසින් රචනා කර ඇති බව
- පඬුරු පාක්කුඩම් යවා ලංකාවට ගෙන්වා ගත් “ගණිතාලංකාර” නම් බමුණු පඬිවරයා රචිත නෙර්ත මාලය නම් කෘති ඇසුරු කරගෙන මල්වතු විහාරවාසී හිමිනමක් විසින් රචනා කර ඇති බව ( කිරිඇල්ලේ ඥාණවිමල හිමි)

**සුවිශේෂ කරුණු**

- මුල්කාලයේදී නරේන්ද්‍රසිංහ රජුගේ විනෝදාස්වාදය සඳහා ගායනා කොට ඇත.
- පසුකාලීනව නර්තනය සඳහා යොදාගෙන ඇත
- වන්නම් ගණනින් 18ක් වේ.

  උදා- හනුමාවන්නම තුරගා වන්නම මුසලඬි වන්නම ගාහක වන්නම සැවුලා වන්නම උකුසා වන්නම සිංහරාජ වන්නම ආදිය කිහිපයකි

## උඩරට වන්නමක ප්‍රධාන කොටස් 6කි .

- බෙර පදය
- තානම
- කවිය
- කස්තිරම
- සීරුමාරුව
- අඩව්ව

කරේය පත්‍රිකාව

1. වන්නම් වල පොදු ලක්ෂණ මොනවාද?
2. උඩරට වන්නම් රචනා වූ අරමුණු හඳුන්වන්න.
3. උඩරට වන්නමක කොටස් නම් කරන්න.

ඉගෙනුම් ආධාරක

You tube

https://www.youtube.com/watch?v=9bANXdDyVN0&t=32s

https://www.youtube.com/watch?v=Veg1HBoesfo

https://www.youtube.com/watch?v=3fhtjmOPbog